ආචාර්ය ටියුඩර් වීරසිංහ

## සමාජ යථාර්ථය නිර්මාණය කිරීමෙහිලා ඡායාරූපයේ සමකාලීන භූමිකාව

පීඨාධිපතිතුමනි, අංශාධිපතිතුමනි, පාඨමාලා සමායෝජකතුමනි, ආචාර්ය මණ්ඩල භවතුනි, ලේඛකාධිකාරීතුමා ප්‍රමුඛ කාර්යය මණ්ඩලයේ භවතුනි, ඩිප්ලෝමාලාභීනී, සම්භාවනීය අමුත්තනි,

කැලණිය විශ්වවිද්‍යාලය මඟින් පවත්වාගෙන යන ඡායාරූපකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ ඩිප්ලෝමා ප්‍රධාන උත්සවයේ මුඛ්‍ය දේශනය පැවැත්වීමට මා හට අවස්ථාවක් ලැබීම මහත් ගෞරවයක් සේ සලකමි. මෙම දේශනය පැවැත්වීමට ආරාධනා කළ පාඨමාලවේ සමායෝජකතුමා ප්‍රමුඛ ආචාර්ය මණ්ඩලයට මගේ ගෞරව පූර්වක ස්තුතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

19 වන සහ 20 වන සිය වස තුළ කලාත්මක චින්තනයේ සහ විද්‍යා-තාක්ෂණිකවේදයේ ප්‍රතිඵලයක් වශයෙන් බිහි වූ ඡායාරූපකරණය මානව වර්ගයාගේ සමාජ, සංස්කෘතික, සෞන්දර්යාත්මක ක්ෂේත්‍රවල වර්ධනය කෙරෙහි සුවිශාල දායකත්වයක් සැපයූවා පමණක් නොව, මිනිසා සහ ලෝකය අතර අන්තර් ක්‍රියාකාරිත්වයේ නව මානයක් ද සනිටුවහන් කළේය. මිනිසාගේ සමාජ-සංස්කෘතික පරිණාමය තුළ දී ඡායාරූප කලාව ආකාස්මිකව පහළවූවක් නොව, එය මාවන වර්ගයාගේ කලාත්මක හා සෞන්දර්යාත්මක පරිණාමයේ නියමානුකූලතාවයේ ප්‍රතිඵලයක් ලෙස බිහිවූ



අතර ඡායාරූපයේ සෘජු පූර්වානුප්‍රාප්තිකයා වූයේ චිත්‍ර කලාවයි. යථාර්ථය වඩාත්ම සදෘශ්‍ය ආකාරයට නිරූපණය කිරීමට මිනිසා සිය ඓතිහාසික ක්‍රියාවලිය තුළ දී විවිධ ප්‍රකාශන ස්වරූප භාවිතයට ගෙන ඇති අතර එහිදී ඡායාරූපයට හෝ ඡායාරූප ප්‍රකාශන මාධ්‍යට හිමි වන්නේ විශේෂ ස්ථානයකි. ඡායාරූපය කලාත්මක අදහස් හා සෞන්දර්යාත්මක චින්තනය විදහා දැක්වීම සඳහා තාක්ෂණික ශක්‍යතා පුළුල් ලෙස භාවිතයට ගත් ප්‍රථම නූතන මාධ්‍ය ලෙස හැඳින්විය හැකිය. ඒ අනුව එය ප්‍රථම තාක්ෂණික කලාව ලෙස සැලකේ. නමුත් ඡායාරූප කලාව මූලික වශයෙන් තාක්ෂණික මාධ්‍යට පමණක් ඌනනය කිරීම අසාධාරණ වන්නේය.

ලෝක ඡායාරූප කලාවේ බිහිවීමේදී පමණක් නොව, එහි විකාශනයේ දී චිත්‍ර කලාව සහ විශේෂයෙන් 19 වන සියවසේ යථාර්ථවාදී සාහිත්‍යයේ නිර්මාණාත්මක අත්දැකීම් තීරණාත්මක බලපෑමක් සිදු කර ඇති බව පෙන්වා දිය යුතුව. 19 වන සියවසේ 20-30 දශක වලදී වර්ධනය වූ ඡායාරූප කලාව පුනරුද යුගයේ සිට දෘශ්‍ය ලෝකය නිරූපණය කිරීමට තාක්ෂණික මාධ්‍යයන් දියුණු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස බොහෝ කලාකරුවෝ කල්පනා කළහ. මිනිස් ජීවිතය සහ ස්වභාවධර්මය පූර්ව ඡායාරූපික මාධ්‍යයන් මඟින් නිරූපණය කිරීමේ ඓතිහාසික සීමා සමතික්‍රමණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් නව සාමාජීය, සංස්කෘතික, කලාත්මක, සෞන්දර්යාත්ම හා ආධ්‍යාත්මික භාවිතයක් ලෙස ඡායාරූප කලාව වර්ධනය වූ බව සඳහන් කළ යුතුය. මේ නිසා ඡායාරූප කලාව සිය ඓතිහාසික වර්ධනයේ ඕනෑම අවධියකදී එය සාමාජීය සහ තාක්ෂණික නිර්මාණාත්මක ක්‍රියාවලියේ වර්ධනයේ අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වයේ ඓන්ද්‍රිය සමස්තයක් ලෙස ඉදිරිපත් වේ.

ඒ අනුව 20 වන සියවස තුළ ඡායාරූප කලාව එක් අතකින් විද්‍යාවේ සහ තාක්ෂණයේ ජයග්‍රහන ද අනෙක් අතින් කලාත්මක හා දාර්ශනික ක්‍රියාවලියේ විශේෂතා ද සමඟින් වර්ධනය වී මිනිස් ජීවිතයේ සියලුම ක්ෂේත්‍ර වලට බලපාන දෛනික ජීවිතයේ වඩාත්ම ප්‍රචලිත භාවිතයක් බවට පත්විය. ක්‍රමානුකූලව ඡායාරූපවේදීන් ඡායාරූප සංහතික

මාධ්‍යවේදීන් බවට පත්වීමේ ප්‍රවණතාව ප්‍රබල වූ අතර, විශේෂයෙන් 1880 වසරේ සිට පුවත්පත්වල ඡායාරූප පළවන්නට විය. 1890 සිට පුවත්පත්වල වාර්තා ඡායාරූප පළවන්නට විය. 20 වන සියවසේ දෙවන දශකය අගදී ඇති වූ ලෝක ආර්ථික අර්බුදය නිසා ඇමරිකා එක්සත් ජනපදයේ සහ යුරෝපයේ විනාශ වූ කෘෂිකාර්මික ක්ෂේත්‍ර යළි ගොඩනැගීම සඳහා සුවිශාල මෙහෙවරක් ඡායාරූප පුවත්පත් කලාව මඟින් සිදු කරන ලදී. ඇමරිකාවේ හා යුරෝපයේ මේ ගැන ඒ ඡායාරූප වාර්තා අදටත් වඩාත්ම ප්‍රදර්ශනය වන්නා වූ ඡායාරූප ලෙස ඉදිහාසගත වන්නේය. මෙය ඡායාරූප සමාජ-ආර්ථික නිරූපණය කිරීමේ යථාර්ථවාදී සංහතික මාධ්‍යයක් ලෙස සිය ශක්‍යතා ප්‍රකට කළ අවස්ථාවකි. මීට අමතරව 20 වන සියවසේ දෙවන දශකයේ දී යුරෝපයේ ඇති වූ අධියථාර්ථවාදය ආදී කලාත්මක චින්තනයේ නූතනවාදී ප්‍රවණතාවල බලපෑම නිසා ඡායාරූප කලාකරුවන්ගේ අවිඥානික හා මනෝමූලික ක්ෂේත්‍ර සිදු වූ ප්‍රබෝධය කලාවක් ලෙස ඡායාරූපකරණයේ අනාගත වර්ධනය කෙරෙහි බලපෑවේය.

දෙවන ලෝක සංග්‍රාමය ඡායාරූප කලාවේ වර්ධනයේ තවත් සුවිශාල සන්ධිස්ථානයක් විය. යුද්ධයේ ස්වභාව සහ එහි දියුණු බව සම්බන්ධව ඡායාරූප පුවත්පත් ඇතුළු සංහතික මාධ්‍ය ඔස්සේ මහජනතාව වෙත ඉදිරිපත් කිරීම කළ අතර, එවරම යුද්ධයේ බේදවාචක සහ සෝචනීය සිද්ධිවලින් හා තත්ත්වයන්ගෙන් වෙනතකට යොමු කිරීමට සමත් ඡායාරූප වාර්තාකරණයේ යෙදෙමින් ඡායාරූප මාධ්‍යවේදී-න් සමාජ-මානසික සම්බන්ධතා ගොඩනැඟීමෙහිලා ඒවා ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යෑම සඳහා අතිවිශාල දායකත්වයක් සැපයීය. යුද්ධයෙන් ලද මිහිරි සහ අමිහිරි, යහපත් සහ අයහපත් සාධනීය සහ නිශේධනීය අත්දැකීම් සහ අසහස් පශ්චාත් යුධ සමයේ ඡායාරූපවේදයේ වර්ධනය සඳහා අවශ්‍ය වූ සංකල්පීය සහ ව්‍යවහාරික පහසු වීමක් ඇති කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඡායාරූපවේදයේ භාවිතය සහ න්‍යාය කෙරෙහි ප්‍රතිසංස්කරණවේදී සහ ධනවාදී අදහස්වල බලපෑම පෙන්වාදිය හැකිය. 1955 වසරේ දී පවත්වන ලද මිනිස් පවුල (The Family of Man) ඡායාරූප ප්‍රදර්ශනය සන්දර්ශන ලෙස ගෙනහැර දැක්විය හැකිය.



සමාජ සංවර්ධනයන් සමඟම ඡායාරූපවේදය ද සෑම අතින්ම පරිණාමය ලක් වූ අතර 50-60 දශක වල දී සිද්ධි හා සමාජ යථාර්ථය නිරූපණ කරමින් ඡායාරූපමාධ්‍යවේදීන්ගේ වෘත්තීය වඩාත් ගතික සහ ජංගමශීලි ස්වරූපයක් ගත්තේය. ක්‍රමානුකූලව ඡායාරූපය මින් පෙර ඇතුළු නොවූ ලෝක වලට ද ඇතුළු වන්නා වූ අතර, එය සමාජය සහ ස්වභාවධර්මය පිළිබඳව මිනිසා දරන ලද ආකල්පයේ මූලික වෙනසකට තුඩු දුන්නේය. එක් අතකින් ඡායාරූපය සාගර පත්ල කරා ද අනෙක් අතින් ඡායාරූප ඈත අභ්‍යාවකාශය කරා ද සිය බලය ව්‍යාප්ත කළේය. 60-70 දශකවල දී ආරම්භ වූ මානව දේහ සංස්කෘතියේ විවිධ පැතිකඩ නිරූපණය කිරීමේ ඡායාරූපකරණ සංහතික ඡායාරූප සංස්කෘතිය වර්ධනය කිරීමේ ක්‍රියාවලිය වේගවත් කළේය.

මේ යුගය වන විට ඡායාරූපකරණය වෙනම සහ සමාජ යථාර්ථය ප්‍රතිනිෂ්පාදනයේ එය මූලික කාර්යයන් අභිබවා විවිධ මිනිස් සහ සමාජ ගතිලක්ෂණ ඡායාරූපකලාවේ පැවැත්ම සහ වර්ධනය සඳහා යොදා ගන්නට විය. ඡායාරූප ප්‍රචලිත කිරීමේ සහ අලෙවි කිරීමේ උපකරණයක් ලෙස ලිංගිකත්වය භාවිත කිරීම නිදර්ශනයක් ලෙස හැඳින්විය හැකිය. 60-70 දශක වල දී ඡායාරූප කලාව සහ ඡායාරූප වාර්තාකරණය විවිධ ප්‍රවණතා ඔස්සේ වර්ධනය වු අතර විවිධ ප්‍රභේද ද බිහි විය.

ප්‍රථම ලෝක යුද්ධය, දෙවන ලෝක යුද්ධය, ලෝක මහා ආර්ථික අර්බුධය, වියට්නාම යුද්ධය, ලෝක විප්ලව ආදී සමාජ දේශපාලන ක්‍රියාවලීන් ද, සංස්කෘතික කලා ක්ෂේත්‍රයෙහි වර්ධනය වූ විවිධ ප්‍රවණතා ද විද්‍යා-තාක්ෂණික ක්‍රියාවලියේ දියුණුව ද ඡායාරූප කලාවේ තාක්ෂණික ශිල්පීය ගති ලක්ෂණ පැතිකඩ, සහ එහි කලාත්මක සෞන්දර්යාත්මක පැතිකඩේ මූලික විපරිවර්තනයන් ඇති කිරීමට ඉවහල් වූ අතර, මේ සියලු ගති ලක්ෂණ සමඟ ඡායාරූපමාධ්‍යවේදය සමාජ සහ සංහතික පාලනයේ, ස්ථාවරත්වයේ ප්‍රබල දෘෂ්ටිවාදී උපකරණයක් බවට පත් වූයේය.

මෙහිදී අපගේ මූලික අවධානය යොමු වන්නේ ලෝක ඡායාරූපකැණයේ වර්ධනයේ තාක්ෂණික පැතිකඩ කෙරෙහි නොව, එහි මානව සමාජීය පැතිකඩ කෙරෙහි ය. විශේෂයෙන් සියලු මානව දේහ, භෞතික බාහිර ලක්ෂණ මෙන්ම ශරීර අභ්‍යන්තරය පමණක් නොව, ශෛල අභ්‍යන්තරය පවා ඡායාරූපගත කිරීමේ හැකියාව අද්‍යතනය වන විට අත්පත් කරගෙන ඇත්තේ ඡායාරූපතාක්ෂණවේදයේ අතිමහත් වර්ධනය කියා පමණි. වර්තමාන ඡායාරූප කලාව ඉතිහාසයේ අන් කවරදාටත් වඩා මිනිසුන්ගේ දෘශ්‍ය පථය එක් අතකින් ප්‍රසාරණය කර තියුණු කර හා ගැඹුරු කර ඇති අතර, අනෙක් අතින් සංකෝචනය කර අතිශයින්ම වස්තුවල මතුපිටට සීමා කර ඇත.

සමකාලීන ඡායාරූපකරණය හා ඡායාරූපය විඥාපනකරණය, ගෝලීයකරණය, පරිගණකකරණය සංඛ්‍යාංකරණය වීම තුළ සංකීර්ණ ස්වරූපයක් අත්පත් කරගෙන තිබේ. ඡායාරූපය සිය වසර 150ක ඉතිහාසයක් තුළ යළිත් පර්යේෂකයින්ගේ සහ ව්‍යවහාරකයින්ගේ කේන්ද්‍රීය අවධානයට යොමුව ඇත. මෙය සමකාලීන සන්දර්භය තුළ ඡායාරූපය සිය ඡායාරූපීය රූපක ඔස්සේ යථාර්ථය පිළිබඳ නව ආකාරයක සම්බන්ධයක් නිර්මාණ කර තිබේ. තාක්ෂණය, රූපක හා සමාජය පාදක කොට නිර්මාණය වී ඇති ඡායාරූපයේ සංකීර්ණතාව සමාජ ප්‍රපංචයක් වශයෙන් විශ්ලේෂණය කිරීමට දාර්ශනික ප්‍රවේශයට හැකියාවක් ඇත. සමාජ දර්ශනවාදය තුළ ඡායාරූපය වර්තමාන සමාජය පිළිබඳ අදහස්වල ස්වරූපයේ හා මාදිලියක් ලෙස ඉදිරිපත් වේ. ඡායාරූපයේ ඉතිහාසය තුළ එය විවිධ විද්‍යාවන් මඟින් ගවේෂණයට හා අධ්‍යයනයට ලක් කර ඇති අතර, විශේෂයෙන් මානව විද්‍යාව, සමාජ විද්‍යාව, මනෝවිද්‍යාව, සෞන්දර්යවේදය, කලාවේදය, සන්නිවේදන විද්‍යාව සහ දර්ශනවාදය ආදී විෂයයන් ඡායාරූපය පිළිබඳ විශේෂ උනන්දුවක් දක්වා තිබේ. සමාජ ජීවිතය සංවිධානය කිරීමේ හා සමාජ විඥානය හැඩගැස්වීමේ ආකාරයක්, උපකරණයක් වශයෙන් ඡායාරූපය සිය ඉතිහාසය තුළ වරින් වර යොදා ගෙන තිබෙන බව පෙන්වා දිය යුතුය. නව දෘශ්‍ය භාවිත සහ මානව සම්බන්ධතා උත්පාදනය කිරීමෙහිලා ඡායාරූපය උපස්ථම්භක වී තිබෙන අතර ඒවා මඟින් සමාජයට හා මිනිසාට අත්වන ප්‍රතිවිපාක ඒක වැදගත්කමක් නොදරන්නේය.



එක් අතකින් ඡායාරූපකරණ ක්‍රියාවලියේ සරලභාවය නිසාත්, ඡායාරූප තාක්ෂණයේ සමීපභාවය නිසාත්, සමාජ සම්බන්ධතා ප්‍රජාතන්ත්‍රීයකරණයේ හා සමාජ-දේශපාලන කටයුතුවල පාරදෘශ්‍යභාවයේ මාධ්‍යයක් බවට පත්වී ඇති අතර අනෙක් අතින් සංහතිකයන්ගේ දෛනික කටයුතු පාලනය කිරීමේ සහ සමාජ සම්බන්ධතා නියාමනය කිරීමේ මාධ්‍යයක් ලෙස විශේෂ ආයතන මඟින් ඡායාරූප මාධ්‍ය භාවිතයට ගනු ලැබේ.

ඡායාරූපය නව මාධ්‍යයන්ගේ ප්‍රථම තාක්ෂණික රූපකය ලෙස ක්‍රියාකරමින් එහි දෘශ්‍යත්වයේ සන්නිවේදනාත්මක ශක්‍යතා ප්‍රකට කරමින් සංහතික මාධ්‍ය අවකාශය වෙනතකට ලක් කළේය. මාධ්‍යකට ලෝකය වටහා ගැනීමේ නව ස්වරූපයක් නිර්මාණය කරමින් ඡායාරූපය ප්‍රේක්ෂකයා හා රූපකය අවකාශයක් හැඩගැස්වීමට සමත් වන්නේය. එම මාධ්‍යයික අවකාශය වෙන් වෙන් වශයෙන් වේදකව හෝ විෂයන්ට සම්බන්ධ නොවන අතර, එය පොදු මාධ්‍යයික අවකාශයක් නිර්මාණය කරන්නේය. සංහතික යුගයේදී ඡායාරූපික නිරූපණ සංජානනය හැකියාව තීර්ණය වන්නේ රූපක විකේතකරණය කිරීමේ සහ අර්ථකථනය කිරීමේ පුද්ගලයා සතු සංවර්ධිත හැකියා මතය. එසේම ඒ සඳහා නව පරිකල්පන ශක්තියක් මෙන්ම නව්‍ය දෘශ්‍ය සාක්ෂරතාවක් ද අවශ්‍ය වන්නේය. මෙම ක්ෂේත්‍ර අධ්‍යයනය කිරීම සඳහා අලුත් ගවේෂණ ක්ෂේත්‍ර කිහිපයක් බිහිවූ අතර, එම ක්ෂේත්‍ර මඟින් ඡායාරූපයේ සහ ඡායාරූපීය රූපකවල වැදගත්කම අධ්‍යයනය කරනු ලැබේ. මේ අනුව නව විෂයයක් ලෙස මාධ්‍ය දර්ශනවාදය දෘශ්‍යරූපකඥානවිභාගය හා නව මාධ්‍ය සන්නිවේදනයේ විශේෂතා අධ්‍යයනය කිරීමේ එක් ධාරාවක් බවට පත් විය. එසේම දෘශ්‍ය සමාජ විද්‍යාව, සන්නිවේදනය, මාධ්‍යවේදය ආදී අධ්‍යයන ක්ෂේත්‍ර මඟින් සමාජ ගවේෂණයේ දී ඡායාරූපයේ ප්‍රජානන ශක්‍යතා උපයෝගීකර ගැනීම සිදු විය. යථාර්ථයේ සහ දෘශ්‍ය මාධ්‍යයන්ගේ අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය සමගාමීයව දාර්ශනිකව අවබෝධ කර ගැනීමට ආවශ්‍යයික අලුත් ගැටලු හා ප්‍රශ්න ඉස්මතු විය. ලෝකයෙහි ආදිපත්‍යයික රූපක යථාර්ථය කෙරෙහි වූ සංවේදිතාව නැතිවීයාමේ ගැටලුව දෘශ්‍ය දූෂණය පිළිබඳ ගැටලුව, තාක්ෂණයේ සහ

උපකරණ මත ප්‍රබලව රඳා පැවැත්ම හේතු කොට ගෙන නිර්මාණශීලීත්වය සහ නිදහස පිළිබඳ ගැටලුව, නව මාධ්‍ය යුගයේ දී පරිකල්පනය සහ සංජානනය පිළිබඳ ගැටලුව ආදිය විසඳීම සඳහා අන්තර්විෂයික අධ්‍යයනයන් අවශ්‍ය වේ. ඡායාරූපය පිළිබඳ සමාජ දාර්ශනික විශලේෂණය මිනිසා හා උපකරණ, රූපක හා සමාජයේ අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වයේ සමාජ නිර්මිතයක් ලෙස සලකා බැලීමට මඟපාදන්නේය.

සමකාලීන ඡායාරූපයේ ප්‍රජානන හා නවීකාරක ශක්‍යතාව පැහැදිලිකර ගැනීම මාධ්‍ය දර්ශනවාදයේ, දෘශ්‍ය සමාජ විද්‍යාවේ හා සමාජ දර්ශනවාදයේ භාවිත විධික්‍රමවලින් තොරව කිසිසේත්ම කළ නොහැකිය. ඡායාරූප කලාවේ ආරම්භක අවධියේ දී ඡායාරූපය හා යථාර්ථය අතර සම්බන්ධතාව සරල ස්වරූපයක් ගත්තේය. වර්තමානය වන විට ඡායාරූපය හා යථාර්ථය අතර හෝ ඡායාරූපීය රූපක හා එම රූපක මඟින් නිරූපිත යථාර්ථය අතර සම්බන්ධතාව සංකීර්ණත්වයකට පමණක් නොව, ඡායාරූපයෙන් නිරූපිත ඡායාරූපීය රූපක හා එමඟින් නියෝජිත යථාර්ථය අතර ප්‍රතිවිරෝධතා හා පරස්පරතා නිරීක්ෂණය වන්නේය.

වර්තමානය වන විට ඡායාරූපයේ පරිණාමය මූලික අවධි ත්‍රිත්වයකට බෙදා ගෙන හැර දක්විය හැකිය. එම වර්ගීකරණය ඡායාරූපීය රූපක පාදක කර ගත් ඡායාරූපයේ සංකල්පීයකරණය මත පදනම් වී ඇත. ඡායාරූපීය රූපකවල හරය හා ඒවා යථාර්ථයට දක්වන සබඳතාව මත සිදුකරන බව සඳහන් කළ යුතුය. ප්‍රථම අවධියේ දී ඡායාරූපය සලකා බලන ලද්දේ යථාර්ථය පරාවර්තනය කිරීමේ මාදිලියක් වශයෙන් වන අතර, දෙවන අවධියේ දී ඡායාරූපය යථාර්ථය විශ්ලේෂණය කිරීමේ මාදිලියක් වශයෙන් ද තුන්වන අවධියේ දී ඡායාරූපය නව යථාර්ථයන් නිර්මාණය (ගොඩනැඟීමේ) කිරීමේ මාදිලියක් වශයෙන් සලකා බලන ලදී.

ඡායාරූපය මඟින් නිරූපිත ඡායාරූපීය රූපකවල වෙනස් වීම එක් අතකින් ඡායාරූපීය තාක්ෂණයේ පරිණාමය මත ද අනෙක් අතින් ඡායාරූපීය රූපක විකේතීකරණය කිරීමේ හා ඒවා අර්ථකථනය කිරීමේ පුද්ගල හැකියාව මත ද



රඳා පවතින බව ෆ්ලූසර් පෙන්වා දෙන්නේය. මෙහිදී අපගේ මූලික අවධානය යොමු වන්නේ ඡායාරූපයේ සංහතික මාධ්‍යයික ගුණය සහ එහි සංහතික දෘෂ්ටිවාදී ගතිකයන් මෙන්ම, සමකාලීන ඡායාරූපය සංහතික සහ සමාජ පාලනයේ උපකරණයක් ලෙස එහි අද්‍යතන භූමිකාව සලකා බැල්මයි.

මේ අනුව ඡායාරූපය මානව වර්ගයාගේ ඉතිහාසයෙහි ප්‍රථම තාක්ෂණික රූපක, ස්වරූප, ප්‍රතිරූපක නිෂ්පාදන මාධ්‍යයක් වශයෙන් සමාජ යථාර්ථයේ නව ස්වරූපයක් ලෙස මාධ්‍ය යථාර්ථය හැඩගැස්වීමේ පූර්ව කොන්දේසියක් ලෙස ඡායාරූපය ඉතිහාසගත විය. ඡායාරූපයේ මාධ්‍යයික ස්වභාවය සංහතික සන්නිවේදන ක්‍රියාවලියේ නව ගුණයන් ද, නව කොන්දේසි ද, සන්දේශයේ නව ගුණාත්මකභාවයක් ද සමාජ සම්බන්ධතාවල නව ප්‍රභේදන ද උත්පාදනය කරන්නේය. ඡායාරූපීය රූපක (ප්‍රතිරූප) සංජානනය කර ගැනීමේ මාදිලිය හා අක්ෂිකිම් මාධ්‍යයේ ප්‍රභේද ඡායාරූපය කියවීමේ යන්ත්‍රණය, සන්නිවේදනයේ වේදක හා විෂය මත රඳා පවතී. සමකාලීන ඡායාරූපය අනන්‍යතාවයේ, පාලනයේ බලයේ හා දනුමේ දෘශ්‍ය සංලක්ෂයක්බවට පත් වී ඇත. ඡායාරූපය ප්‍රේක්ෂකයා හා වස්තුව (විෂය) අතර දුරස්තභාවය සංකෝචනයකර ඇති අතර, දැකීමේ සීමා ප්‍රසාරණය කර ඇත. සත්‍ය, යථාර්ථය හා රූපක අතර සමානත්මතාව ගොඩනඟන ලද ප්‍රථම ශිෂ්ටාචාරය අපි වන්නෙමු යැයි බෝද්‍රිලාර්ඩ් පෙන්වා දෙන්නේ ය.

මානව වර්ගයාගේ සමාජ පරිණාමය වර්තමානය වන විට උපරි සමාජයක් දක්වා ගමන්කර තිබේ. මානව වර්ගයා සිය ඉතිහාසය තුළ පූර්ව සමාජය, සමාජය සහ උපරි සමාජය දක්වා පරිණාමීය ප්‍රවණතාව ඔස්සේ ගමන්කර ඇත. මෙම සමාජ පරිණාමීය ක්‍රියාවලියට සමගාමීයව මානව වර්ගයාගේ දෘශ්‍ය සංස්කෘතික පරිණාමය ද ගමන්කර ඇති බව අපගේ අදහසයි. මානව වර්ගයාගේ පූර්ව සමාජ දෘශ්‍ය-සංස්කෘතික තලයේ දි යථාර්ථය සෘජු ලෙසම ග්‍රහනය කර ගත් අතර, සමාජ දෘශ්‍ය-සංස්කෘතික තලයේ දි යථාර්ථය ප්‍රතිනිර්මාණාත්මව සංස්කරණය කිරීම තුළ ග්‍රහනය කරගත් අතර උපරි සමාජ දෘශ්‍ය-සංස්කෘතික තලයේ දි යථාර්ථය නිර්මාණය කිරීම තුළ

ග්‍රහනය කර ගැනීම සිදු වන්නේය. මෙම අද අප ජීවත් වන උපරි සමාජය දෘශ්‍ය-සංස්කෘතික යුගයේ දී ඡායාරූපයේ හරය හා වැදගත්කම නිර්ණය වන්නේ එහි කලාත්මක වස්තුමය හෝ වාර්තාමය වටිනාකම මත නොව, නිරූපණයේ මතුපිට ප්‍රදර්ශන තොරතුරු මත බව අවධාරණය කළ යුතුය. නමුත් තවමත් සංඛ්‍යාංක ඡායාරූපය සිය පරිණාමයේ පූර්ව ගතිලක්ෂණ යම් ප්‍රමාණයකින් යථාර්ථය පරිවර්තනයේ සහ ප්‍රතිනිෂ්පාදනයේ හැකියාව සම්පූර්ණයෙන්ම අහිමි කරගෙන නොමැත. නමුත් අද්‍යතන පරිගණක හා තථ්‍යාසන්න දෘශ්‍ය සන්නිවේදන තාක්ෂණය පාදක කරගෙන නව සංස්ලේෂීය සංඛ්‍යාංක රූපක (ප්‍රතිරූප) උත්පාදන කිරීමේ අවධියකට අපි දැන් ප්‍රවේශ වෙමින් සිටින්නෙමු.

සමකාලීන හා විශේෂයෙන් අනාගත ඡායාරූපවල සංස්ලේෂීය රූපකවල සමාජ දාර්ශනික අනිශ්චිය ප්‍රේක්ෂකයා තුළ මායාකාරී රූපක නිර්මාණය කිරීමත්, ප්‍රේක්ෂක පරිකල්පණය මෙහෙයවීමේත් ප්‍රේක්ෂකයාව මුළා කිරීමේත් ගුණයන් අධ්‍යයනය කිරීම සමඟ සම්බන්ධ බව පෙන්වා දිය යුතුය. විශේෂයෙන් සංඛ්‍යාංක තාක්ෂණය බිහිවීමත්, සාමාර්ථයත් තාක්ෂණික මාදිලිය සංඛ්‍යාංක ඡායාරූප මාදියට පරිවර්තනය වීමත් තිර දෘෂ්‍ය සංස්කෘතියේ ව්‍යාප්තියත් ඡායාරූපයේ සත්භාවාත්මක තත්ත්වය වෙනස්වීම කෙරෙහි තීරණාත්මකව බලපාන්නේය. මෙහිදී විශේෂයෙන් අවධාරණය කළ යුතු කාරණය වන්නේ සංඛ්‍යාංක ඡායාරූපය යනු උපරි සමාජීය මිනිසා යථාර්ථය සමඟ අන්‍යෝන්‍ය ක්‍රියාකාරීව මිශ්‍ර වීමකි. එසේ සංඛ්‍යාංක රූපික, ස්වරූප, ප්‍රතිරූප මූලයක් නොදරන්නේ ය. මක්නිසාද යත් එය ප්‍රාරම්භයේ සිටම පවතින්නේ සංඛ්‍යාංක කේතයක් ලෙස නිසාය. එනම් සංඛ්‍යාංක කේතය තුළ ඇතුළත් අන්තර්ගතය කිසිම දේහයකට හෝ සැබෑ වස්තුවකට කිසිම සම්බන්ධයක් නොමැති අතර, එය ස්වාධීනව සම්පූර්ණයෙන්ම නිදහස්ව පවතී. වර්තමානයේ සංහතික මාධ්‍ය සන්දර්භය තුළ ඡායාරූපයේ සිදු වන්නා වූ මේ වෙනස්කම් යථාර්ථය ගැන දෘශ්‍ය පරාවර්තනයක් වශයෙන් ඡායාරූපයේ භූමිකාව අතිමහත් ලෙස වර්ධනය කරන්නේය.



මේ අනුව මානව වර්ගයාගේ සමකාලීන සමාජ පරිණාමීය මට්ටමේ දී රූපක, ස්වරූප සංජානනයේ අපේ මාදිලිය හා අත්දැකීම් මාධ්‍ය මත හෝ සංහතික සන්නිවේදන මාධ්‍යයන් මත රඳා පවතින්නේය. ඡායාරූපය මඟින් සමකාලීන යථාර්ථය ගොඩනැඟීම ආකාර කිහිපයකින් සිදුවන්නේය. සැබෑ සිද්ධි පිළිබඳව මතකය, ස්මෘතිය සංරක්ෂණය සා සම්ප්‍රේෂණය, යථාර්ථය ගවේෂණයේ හා සාක්ෂාත්කරණයේ මාදිලියක් ලෙස, යථාර්ථයේ ප්‍රතිනිර්මාණයේ සහ ප්‍රතිසංස්කරණයේ මාදිලියක් ලෙස ඡායාරූපය යථාර්ථය ගොඩනැඟීමේ ක්‍රියාවලියට සම්බන්ධ වේ.

අවසාන වශයෙන් සමකාලීන මිනිසාගේ දෛනික ජීවිතයේ වලන අද්‍යතන ඡායාරූපය මඟින් නිරූපණය කරනවා පමණක් නොව, නවීන ඡායාරූපීය භාවිතයන් ඔස්සේ මිනිසාගේ දෛනික ජීවිතය අරමුණු සහගතව හා සවිඥානිකව විවිධ බලවේගවල අවශ්‍යතා වලට අනුකූලව ප්‍රතිනිර්මාණය කිරීමේ හැකියාව සමකාලීන ඡායාරූප අත්පත් කරගෙන ඇත. සමකාලීන ඡායාරූපය දෘශ්‍ය සංස්කෘතිය සහ සාමාජීයත්වය නිර්මාණය කිරීමේ කේන්ද්‍රීය සාධකය බවට පත් වී තිබේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


- Baudrillard, J. For Illusion isn`t the Opposite of Reality// Photographies 1985-1998/ J. Baudrillard. S.I. Hatje Cantz Publishers, 1999
- Flusser V. Writings/ V. Flusser. Minneapolis University of Minnesota Press, 2002
- Davenpor T.A. The History of Photography. University of New Mexico Press, 1999
- Walden S. Objectivity in Photography// Brit. J of aesthetics. L, 2005 Vol.45
- Alexander J. Iconic Experience in Art & Life// Theory, Culture and Society, 2008
- Bateson G. Steps to An Ecology of Mind. Ballantine, 1972
- වීරසිංහ, වියුඩර්. (2015). පශ්චාත් ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ සංහතික මාධ්‍ය සංස්කෘතිය සමාජ හා සංහතික පාලනයේ නව උපකරණයක් ලෙස. සංස්ග ධර්මකීර්ති ශ්‍රී රන්ජන්. ජනමාධ්‍යවේදය අධ්‍යයන හා විචාර, මාධ්‍ය සංස්කෘතිය. වෙළුම 05. පිටු 15-48